ටිකක් සේනට පෙන්නන්නම්." සෝමේ ඇඟටපතට නොදැනී කියා දැම්මේ ය.

සෝමෙත් මිල්ටන් ජයවර්ධනත් එදා මැදියම් රැයේම රඹුක්කන සිට කොළඹට එන්නට පිටත් විය. හාත්පස වෙලාගෙන තිබූ අන්ධකාරයේ නිහැඬියාව බිදිමින් මිල්ටන් හඬ අවදි කළේය.

"උඹ මොකද බං සේනට බොරු කිව්වෙ දසේ කරපු ජෝතිගෙ සිංදු පෙන්නනං කියල"
"මචං මිල්ටන් , දසේ කරපු ජෝතිගෙ සිංදු හතරක් තියෙනවා"

"පිස්සුද උඹට දසේ කොහෙද ජෝතිට සිංදු කළේ"

මිල්ටන් සත්තමක් දැම්මේ ය. සෝමේ එතෙක් සඟවාගෙන සිටි රහස හෙළි කරන්නට විය.

" නෑ මචං, දසේ ජෝතිට සිංදු හතරක් කරල තියෙනවා. තාම තැටි නිකුත් කරල නෑ. හැබැයි දසේ ඒව වෙනත් කෙනෙකුට විකුණලා" සෝමපාල ලීලානන්ද මිල්ටන්ට කීවේ ය.

**මල්සර මල් දුන්නේ - මල් හි සැර එන්නේ**
**මගෙ දෙනෙතෙහි සැංගී - කවුරුද සැතපෙන්නේ**

**නිසසල තනි ලිය ගොමුවේ - චංචල සුළඟකි හැමුවේ**
**නුපුරුදු සිතුවිලි බිහිවේ - එනු හිනැහෙනු මා හමුවේ**

**බෙද බෙද මධුරස මියුරූ - සුව ගෙන දෙන මට නුහුරූ**
**සැඟවෙනවද කොයි කවුරූ - එනු මැන පෙන්වා රුසිරූ**

**පද රචනය - කරුණාරත්න අබේසේකර**
**සංගීතය - සරත් දසනායක**
**ගැයුම - එච්. ආර්.ජෝතිපාල**

සංගිතයට ලැදි මුස්ලිම් තරුණයෙක් සිටියේ ය. ඔහු නමින් ශාන් ය. යහමින් මුදල් හදල් තිබුණ ඔහුට ජනප්‍රිය වීමේ නොතිත් ආශාවක් තිබුණි. ශාන් බෙහෙවින්ම සංගිතයට ඇලූම්කමක් දැක්වූ අයෙකි. යම් ප්‍රමාණයක සංගීතය පිළිබඳ දැනුමක් තිබුණත් ඔහුට අවශ්‍ය වූයේ එච්.ආර්.ජෝතිපාල යොදාගෙන ඒවායේ සංගීත නිර්මාණ තමන්ගේ තහවුරු වන විදියට ගීත හරතරක් නිෂ්පාදනය කර වෙළඳ පොලට නිකුත් කරවා ගැනිමට ය. ඒවන විටත් ලංකාවේ ගී තැටි නිෂ්පාදනය සහ අලෙවිය බෙහෙවින්ම ජනප්‍රියවී තිබුණි. පේම්ටෝන්, සිල්වර් ලයින්, සූරිය, සහ සරස්වතී වැනි ලේබල් වලින් අලෙවි වූ ගී තැටි වලට වෙළඳ පොලේ හොඳ ඉල්ලූමක් ද තිබුණි.

ශාන් තමගේ ඉල්ලීම සරත් දසනායක වෙත ඉදිරිපත් කර තිබුණි. සංගීතය ශාන්ගේ යැයි සඳහන් වන ගීත හතරක් ජෝතිපාල ලවා පටිගත කර දෙන එක සුදුසු ද නැද්ද යන්න දසේට ගැටළුවක් ව තිබුණි. දසේ මේ ගැන විමසුවේ සෝමපාල ලීලානන්ද ගෙනි.

"කමක් නෑ හොඳට ගෙවනවා නම් කරන්න"

සෝමේ දසේට කීවේ ය. දසේ කරු අයියා (කරුණාරත්න අබේසේකරයන්) ලියාදුන් ගීත හතරකට තනු දමා පටිගතකර ශාන්ට දී මුදල් ලබාගෙන ය. ගීත අඩංගු හඬ පටය තැටි කැපීම සඳහා සෝමපාල ලීලානන්ද ට භාරදී තිබුණි. තවමත් ගී තැටි කැපී නැත. ගීත තැටි වෙළඳපොලට නිකුත්වන විට ඒවා දසේගේ නොවුණත් ඒ ගීත ඇත්තටම දසේගේ ය.

"මම ඒ ගීත හතර සේනට ගහලා පෙන්නනවා" එදා රෑ සෝමේ රඹුක්කන සිට කොළඹ බලා එන ගමන්ම මිල්ටන් ජයවර්ධනට කීවේ ය . ඒ රාත්‍රියේදිම සෝමේ ඒ දැඩි තීරණයට එළඹුණේ කෙසේ හෝ සරත් දසනායක සේනගේ චිත්‍රපටයට දමාගැනිමට ය.

"ඒත් ඒ තැටි අවුට් වෙන දාට බොරුව එළි වෙනවන" මිල්ටන් කීවේය.
"ඒ එළිවෙන්නෙ ශාන් කරපු බොරුවනෙ මේ කතාවෙ ඇත්ත එළිවෙන්නෙ මං මේ කතාව එළි කරපු දවසටනෙ" සෝමේ මිල්ටන්ට කීවේය.

දින කීපයකින් මිල්ටන් සහ සෝමේ සරත් දසනායක විසින් ජෝතිපාලට නිර්මාණය කළ ඒ ගීත හතර ඇතුළත් හඬ පටයද රැගෙන සේන සමරසිංහ හමුවීට රඹුක්කන ගියහ. ගීත හතර සේනට අහන්නට සැලැස්වී ය. සේන විශ්මයට පත් කළ ගීත හතරක් එහි විය. මේ එදා සේන ඇසූ සරත් දසනායක ජෝතිට මුල්වරට හැදූ ගීත හරයි.

1. නීල දෑස පුරා
2. ඔබ නිදන්න ඔබ නිදන්න
3. මල්සර මල් දුන්නේ
4. අද අමුතුම රැයකී.

ගීත හතර ඇසූ පමණින් සේනගේ අදහස් සියල්ල සම්පූර්ණයෙන් වෙනස් විය. සරත් දසනායක සේනගේ චිත්‍රපටයේ සංගීත අධ්‍යක්ෂණයට දමා ගැනිමට සෝමේ සහ මිල්ටන් කළ දැවැන්ත සටනින් ඔවුන් දෙදෙනාට ජය අත්විය.

මේ දැක්වෙන්නේ එදා දසේ මුල්වරට ජෝතිපාලට හැදූ අති මධුර ස්වතන්ත්‍ර ගීත හතරයි. බොහෝ දෙනෙක් මේ ගීත අසා ඇතත්, යමෙකුට නැවත නැවතත් මේ ගීත අහන්නට අවශය නොවුණත් මේ කතාවත් සමග ඒ ගීත හතර අමරණීය ඉතිහාසයක් ජෝතිපාලගේ ගීත ලැයිස්තුවට එකතු කර තිබේ.

**අද අමුතුම රැයකී - හොඳ සිතල පැයකී**
**අඳුරු වලා වැළකී - මගෙ හිත සතුට දකී**

**ගණ නිල් වරලින්නේ - මල් සුවඳකි එන්නේ**
**හද විනිවිද යන්නේ - නෙත් යුග පිබිදෙන්නේ**

**නිලූපුල් වැනි දෑසේ - සැතපි ඇති රහසේ**
**තේරුම තෝරාලා -දෙනු මැන හිනැහීලා**

**සුලලිත මුදු වරලේ - අඩවන් සඳ බැබලේ**
**නාදලූ බඳු දෙතොලේ - සිහිවෙයි මධු කොතලේ**

**පද රචනය - කරුණාරත්න අබේසේකර**
**සංගීතය - සරත් දසනායක**
**ගැයුම - එච්. ආර්.ජෝතිපාල**

මේ අතීත පුවත මගේ නිර්මාණයක් නොවේ. එච්.ආර්.ජෝතිපාල, කරුණාරත්න අබේසේකර සහ සරත් දසනායක යන ජනප්‍රිය සංගීතයේ මහා විස්කම් කළ ත්‍රිමූර්තියම අද අප අතර නැත. එසේම මධුර චිත්‍රපට හැදූ සේන සමරසිංහ - සෝමපාල ලිලානන්ද - මිල්ටන් ජයවර්ධන - සරත් දසනායක සිවුමහා බලකණුවලින් අද අපට සිටින්නේ සේන සමරසිංහ සහ සෝමපාල ලීලානන්ද පමණි. ජෝතිපාල - සරත් දසනායක අපූරු සුසංයෝගය බිහිකළ මේ අතීත පුවත මුල්වරට හෙළිකර තිබුණේ මීට වසර කිපයකට කලින් සෝමපාල ලිලානන්ද විසිනි. ඒ ඔහු අතීතර සැමරුම් ඇසුරින් ඔහු ලියා පළ කළ "පාට පොදක ගමන් විත්ති" කෘතියෙනි. ගීත වගේම ඒ ගීතවල නොපෙනෙන ඇතුලාන්තය වඩාත් මිහිරි වන්නේ ඒ නිසා ය.

ආශ්‍රිත ග්‍රන්ථ -
01. පාට පොදක ගමන් විත්ති - සෝමපාල ලීලානන්ද කෘතියෙන්
02. තිස්වසරක සරත් සර - සමරුව 1999

aswanna







